᳐ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2410/09 - 2024 නොවැම්බර් මස 17 වැනි ඉරිදා - 2024.11.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**07 වන සංශෝධනය**

ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහය

පහත 1 කොටසෙහි සඳහන් පරිදි සංශෝධිත 2014 ඔක්තෝබර් 11 දිනැති 1883/17 අංක දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රසිද්ධ කරන ලද, ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත II කොටසෙහි සඳහන් පරිදි නැවත සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

**ඩබ්ලිව්. එච්. එම්. එම්. සී. කේ. දයාරත්න,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2024 නොවැම්බර් මස 12 වැනි දින.

**I** කොටස

සංශෝධනය අංක 01 - 2016 ජනවාරි මස 18 දිනැති අංක 1950/4 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධනය අංක 02 - 2016 අගෝස්තු මස 24 දිනැති අංක 1981/45 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධනය අංක 03 - 2016 දෙසැම්බර් මස 09 දිනැති අංක 1996/46 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධනය අංක 04 - 2021 මාර්තු මස 09 දිනැති අංක 2218/50 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධනය අංක 05 - 2022 අප්‍රේල් මස 29 දිනැති අංක 2277/59 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධනය අංක 06 - 2023 දෙසැම්බර් මස 22 දිනැති අංක 2263/83 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රය*

1A - G 43112 — 04 (2024/11)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**II කොටස**

11.1.2 වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ තනතුරුවලට පත්වීමට අදාළ අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් යටතේ දක්වා ඇති වගුව වෙනුවට පහත වගුව ආදේශ කරනු ලැබේ. අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී.

| තනතුර/ශ්‍රේණිය | (අ) අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|
| 11.1.2.1 නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණිය | I. වෛද්‍ය සේවා ව්‍යවස්ථාවේ පරිශිෂ්ඨ II හි ලැයිස්තුගත කරන ලද පශ්චාත් උපාධි සුදුසුකම ලබා ඇති වෛද්‍ය නිලධාරියෙකු හෝ දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු හෝ විශේෂඥ වෛද්‍ය නිලධාරියෙකු, III පරිශිෂ්ඨයෙහි සඳහන් නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ තනතුරු සඳහා අයදුම් කිරීමට හිමිකම් ලබයි.<br>II. ලකුණු ලබාදීමේ ක්‍රමය යටතේ ඉහත සඳහන් මූලික සුදුසුකම සඳහා ලකුණු ලබා නොදෙන අතර, ඊට අමතරව II පරිශිෂ්ඨයෙහි සඳහන් ඉහත මූලික සුදුසුකමට වඩා ඉහළ පශ්චාත් උපාධි සුදුසුකමක් හෝ I පරිශිෂ්ඨයෙහි සඳහන් වෛද්‍ය විශාරද උපාධියක් ලබා ඇති වෛද්‍ය නිලධාරියෙකු හෝ දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු හෝ විශේෂඥ වෛද්‍ය නිලධාරියෙකු සඳහා අමතර ලකුණු ලබා දෙනු ලැබේ.<br>III. දෙපාර්තමේන්තුවෙහි වසර 8ක අඛණ්ඩ සේවයක් සහිත (වසර 8ක කාලය ගණනය කරනු ලබන්නේ ප්‍රාථමික ශ්‍රේණියට ඇතුලත් වූ දින සිටය) II ශ්‍රේණියට උසස් වීම් ලද කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වෛද්‍ය නිලධාරියෙකු/ දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු/ විශේෂඥ වෛද්‍ය නිලධාරියෙකු වීම.<br>IV. නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණිය යටතට ගැනෙනා සමාන තනතුරු පරිශිෂ්ඨ III හි ඇතුළත් කෙරෙන අතර සේවා අවශ්‍යතා මත වරින් වර නිර්මාණය කරනු ලබන කවර තනතුරක් වුව ඊට ඇතුළත් කෙරේ.<br>V. වයස් සීමාව: සියලුම නිලධාරීන් දැනටමත් රාජ්‍ය සේවයේ සිටින්නන් වන හෙයින් උපරිම වයස් සීමාව අදාළ නොවේ.<br>VI. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා ඊට ආනුෂංගික චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය. |

| තනතුර/ශ්‍රේණිය | (අ) අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|
| 11.1.2.2 ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණිය | I. වෛද්‍ය සේවා ව්‍යවස්ථාවේ පරිශිෂ්ඨ II හි ලැයිස්තුගත කරන ලද විද්‍යාපති (වෛද්‍ය පරිපාලන) උපාධියක් හෝ විද්‍යාපති (ප්‍රජා වෛද්‍ය හෝ ප්‍රජා දන්ත වෛද්‍ය) උපාධියක් ලබා ඇති වෛද්‍ය නිලධාරියෙකු හෝ දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු හෝ විශේෂඥ වෛද්‍ය නිලධාරියෙකු IV පරිශිෂ්ඨයෙහි සඳහන් ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ තනතුරු සඳහා අයදුම් කිරීමට හිමිකම් ලබයි.<br>II. ලකුණු ලබා දීමේ ක්‍රමය යටතේ ඉහත සඳහන් මූලික සුදුසුකම සඳහා ලකුණු ලබා නොදෙන අතර වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන) උපාධිය හෝ වෛද්‍ය විශාරද ( ප්‍රජා වෛද්‍ය හෝ ප්‍රජා දන්ත වෛද්‍ය) උපාධිය ලබා ඇති වෛද්‍ය නිලධාරියෙකු හෝ දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු හෝ විශේෂඥ වෛද්‍ය නිලධාරියෙකු සඳහා අමතර ලකුණු ලබා දෙනු ලැබේ.<br>III. නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ අවම වශයෙන් වසර 3 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.<br>IV. ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණිය යටතට ගැනෙනා සමාන තනතුරු පරිශිෂ්ඨ IV හි ඇතුළත් කෙරෙන අතර සේවා අවශ්‍යතා මත වරින් වර නිර්මාණය කරනු ලබන කවර තනතුරක් වුව ඊට ඇතුළත් කෙරේ.<br><br>සටහන 7 : ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණිය යටතට ගැනෙනා සෑම තනතුරක් සඳහා වන අනිවාර්ය සුදුසුකම් IV පරිශිෂ්ඨයේ සඳහන් විය යුතු අතර මෙකී තනතුරු සමාන තනතුරු සේ සැළකිය යුතුය. |

| තනතුර/ශ්‍රේණිය | (අ) අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|
| | V. එහි තනතුරු සඳහා අයදුම්පත් කැඳවීමේදී අයදුම්කරුවන් IV පරිශිෂ්ඨයේ ලැයිස්තුගත කර ඇති අදාළ අනිවාර්ය පශ්චාත් උපාධි සුදුසුකම් ලබා තිබිය යුතුය.<br>VI. වයස් සීමාව: සියලුම නිළධාරින් දැනටමත් රාජ්‍ය සේවයේ සිටින බැවින් උපරිම වයස් සීමාව අදාළ නොවේ.<br>VII. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා ඊට ආනුෂංගික චක්‍රලේඛයන් හි සඳහන් විධි විධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය. |

| තනතුර/ශ්‍රේණිය | (අ) අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|
| 11.1.2.3 නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රේණිය | I. වෛද්‍ය සේවා ව්‍යවස්ථාවේ පරිශිෂ්ඨ II හි ලැයිස්තු ගත කරන ලද විද්‍යාපති (වෛද්‍ය පරිපාලන) උපාධියක් හෝ විද්‍යාපති (ප්‍රජා වෛද්‍ය හෝ ප්‍රජා දන්ත වෛද්‍ය) උපාධියක් ලබා ඇති වෛද්‍ය නිලධාරියෙකු හෝ දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු හෝ විශේෂඥ වෛද්‍ය නිලධාරියෙකු V පරිශිෂ්ඨයෙහි සඳහන් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රේණියේ තනතුරු සඳහා අයදුම් කිරීමට හිමිකම් ලබයි.<br>II. ලකුණු ලබා දීමේ ක්‍රමය යටතේ ඉහත සඳහන් මූලික සුදුසුකම සඳහා ලකුණු ලබා නොදෙනු ලබන අතර වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන) උපාධිය හෝ වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය හෝ ප්‍රජා දන්ත වෛද්‍ය) උපාධිය හෝ මණ්ඩල සහතිකය (වෛද්‍ය පරිපාලන) හෝ මණ්ඩල සහතිකය (ප්‍රජා වෛද්‍ය හෝ ප්‍රජා දන්ත වෛද්‍ය) ලබා ඇති වෛද්‍ය නිලධාරියෙකු හෝ දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු හෝ විශේෂඥ වෛද්‍ය නිලධාරියෙකු සඳහා අමතර ලකුණු ලබා දෙනු ලැබේ.<br>III. ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරින් හා දන්ත ශල්‍ය වෛද්‍යවරුන් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රේණි නිලධාරීන් ලෙස පත් කිරීමට සුදුසු වේ.<br>IV. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රේණිය යටතට ගැනෙන තනතුරු V පරිශිෂ්ඨයේ දැක්වෙන අතර සේවා අවශ්‍යතාවයන් ප්‍රකාරව කලින් කලට ඇති කරන ඕනෑම තනතුරක් ඊට ඇතුලත් වේ.<br>V. වයස් සීමාව: සියලුම නිලධාරීන් දැනටමත් රාජ්‍ය සේවයේ සිටින නිලධාරීන් බැවින් වයස් සීමාව අදාළ නොවේ.<br>VI. මෙම ශ්‍රේණියට අදාළ උසස්වීම් පටිපාටියක් නොමැත.<br>VII. මෙම ව්‍යවස්ථාවෙහි 11.1.1 වගන්තිය යටතේ වන පත්වීම්වලට අදාළ පොදු මාර්ගෝපදේශයන් අවශ්‍යතාවය පරිදි අදාළ කරගත යුතුය.<br>VIII. ස්ථාන මාරු V පරිශිෂ්ඨයේ සඳහන් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රේණිය යටතට ගැනෙන සියලුම තනතුරු අවසන් තනතුරු වන අතර ස්ථාන මාරුවලට යටත් නොවේ.<br>IX. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා ඊට ආනුෂංගික චක්‍රලේඛයන් හි සඳහන් විධි විධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.<br><br>සටහන 8: ඉහත සඳහන් සුදුසුකම් වලට අමතරව විශේෂ තත්ත්වයන් ලෙස සලකා V පරිශිෂ්ඨයෙහි දක්වා ඇති පරිදි නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (දන්ත වෛද්‍ය සේවා) තනතුර සඳහා විද්‍යාපති (ප්‍රජා දන්ත වෛද්‍ය) උපාධිය මූලික සුදුසුකමක් සේ සැලකේ. එම සුදුසුකම සහිත නිලධාරීන් නොමැති අවස්ථාවලදී විද්‍යාපති (ප්‍රජා වෛද්‍ය හෝ වෛද්‍ය පරිපාලන) සුදුසුකම සහිත නිලධාරීන් ද සලකා බලනු ලැබේ.<br><br>සටහන 9: කෙසේ වුවද 2007.04.16 දිනැති අංක 1493/3 දරන ගැසට් නිවේදනය ක්‍රියාත්මක වන විට ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුර දරන නිලධාරීන්ට මෙම අනිවාර්ය සුදුසුකම් අදාළ නොවේ. ඔවුන්ට තම වර්තමාන තනතුරු දැරිය හැකි අතර අනිවාර්ය සුදුසුකම නොසලකා ඔවුන් V පරිශිෂ්ඨය යටතට ගැනෙන අන් කවර තනතුරකට වුව පත්කළ හැකිය. |

පරිශිෂ්ඨ IV - ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණිය යටතේ වන තනතුරු ඇතුලත් IV පරිශිෂ්ඨයේ එම තනතුරුවලට උසස් කිරීම සඳහා "අවශ්‍ය කරන අනිවාර්ය අධ්‍යාපන සුදුසුකම්" තීරුව යටතේ එක් එක් තනතුරට අදාල අනිවාර්ය සුදුසුකම දැක්වෙන සෑම ස්ථානයක්ම පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

| | සේවා ව්‍යවස්ථාවේ සඳහන් ආකාරය | අනිවාර්ය සුදුසුකම (සංශෝධනය කරනු ලබන ආකාරය) |
|---|---|---|
| 1 | විද්‍යාපති / වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය / ප්‍රජා දන්ත වෛද්‍ය / වෛද්‍ය පරිපාලන) | විද්‍යාපති (ප්‍රජා වෛද්‍ය / ප්‍රජා දන්ත වෛද්‍ය / වෛද්‍ය පරිපාලන) |
| 2 | විද්‍යාපති / වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන) | විද්‍යාපති (වෛද්‍ය පරිපාලන) |
| 3 | විද්‍යාපති / වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය / ප්‍රජා දන්ත වෛද්‍ය) | විද්‍යාපති (ප්‍රජා වෛද්‍ය / ප්‍රජා දන්ත වෛද්‍ය) |
| 4 | වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය / ප්‍රජා දන්ත වෛද්‍ය) | විද්‍යාපති ( ප්‍රජා වෛද්‍ය / ප්‍රජා දන්ත වෛද්‍ය) |

පරිශිෂ්ඨ V - නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රේණිය යටතේ වන තනතුරු ඇතුලත් V පරිශිෂ්ඨයේ එම තනතුරු වලට උසස් කිරීම සඳහා "අවශ්‍ය කරන අනිවාර්ය අධ්‍යාපන සුදුසුකම්" තීරුව යටතේ එක් එක් තනතුරට අදාල අනිවාර්ය සුදුසුකම දැක්වෙන සෑම ස්ථානයක්ම පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

| | සේවා ව්‍යවස්ථාවේ සඳහන් ආකාරය | අනිවාර්ය සුදුසුකම (සංශෝධනය කරනු ලබන ආකාරය) |
|---|---|---|
| 1 | විද්‍යාපති / වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය / වෛද්‍ය පරිපාලන) | විද්‍යාපති (ප්‍රජා වෛද්‍ය / වෛද්‍ය පරිපාලන) |
| 2 | විද්‍යාපති / වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන) | විද්‍යාපති (වෛද්‍ය පරිපාලන) |
| 3 | විද්‍යාපති / වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය) | විද්‍යාපති (ප්‍රජා වෛද්‍ය) |
| 4 | විද්‍යාපති / වෛද්‍ය විශාරද ( වෛද්‍ය පරිපාලන / ප්‍රජා දන්ත / ප්‍රජා වෛද්‍ය) | විද්‍යාපති ( වෛද්‍ය පරිපාලන / ප්‍රජා දන්ත / ප්‍රජා වෛද්‍ය) |

අන්තර්කාලීන විධිවිධාන

ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණිය හා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රේණියේ තනතුරුවලට තෝරා ගැනීමේදී පිළිවෙලින් 11.1.2.2 හි සහ 11.1.2.3 හි සඳහන් මූලික සුදුසුකම අදාල කර ගැනීම, මෙම සංශෝධනය බලාත්මක වන දින සිට ක්‍රියාත්මක වනු ඇත. එම බලාත්මක දිනය වන විට දැනටමත් නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ හා ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ තනතුරුවල සිටින නිලධාරීන්ට මෙම සංශෝධනය බලාත්මක වන දින සිට වසර 03ක අන්තර් කාලයක් දක්වා පමණක් තනතුරු සඳහා තෝරා පත්කර ගැනීමේදී පහත පරිදි කටයුතු කළ යුතු වේ.

I. ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියට අයදුම් කිරීමේදී නිලධාරියා ලබාගෙන ඇති ඉහලම සුදුසුකම අනුව, විද්‍යාපති (වෛද්‍ය පරිපාලන/ප්‍රජා වෛද්‍ය/ ප්‍රජා දන්ත වෛද්‍ය) හෝ වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන/ප්‍රජා වෛද්‍ය/ප්‍රජා දන්ත වෛද්‍ය) යන දෙකෙන් එකකට ලකුණු හිමි වේ.

II. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රේණියට අයදුම් කිරීමේදී නිලධාරියා ලබාගෙන ඇති ඉහලම සුදුසුකම අනුව, විද්‍යාපති (වෛද්‍ය පරිපාලන/ප්‍රජා වෛද්‍ය/ ප්‍රජා දන්ත වෛද්‍ය) හෝ වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන/ප්‍රජා වෛද්‍ය/ප්‍රජා දන්ත වෛද්‍ය) යන දෙකෙන් එකකට ලකුණු හිමි වේ.

EOG 11 - 0137

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.